සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணைப்பரீட்சை - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය- පත්‍රය I<br>வணிகமும் கணக்கீட்டுக் கல்வியும்வினாத்தாள் I<br>Business & Accounting Studies Paper I | පැය එකයි<br>ஒரு மணித்தியாலங்கள்<br>One Hours |

උපදෙස් :-

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 2 3 4 යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01. ව්‍යාපාරයක් යන්න වඩාත් හොඳින් විස්තර කෙරෙන ප්‍රකාශය වන්නේ,
   1. භාණ්ඩ හා සේවා අලෙවිකරණ ඕනෑම ස්ථානයක්.
   2. නිෂ්පාදන මිලට ගෙන බෙදා හරිනු ලබන ස්ථානයක්.
   3. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරන ඕනෑම කටයුත්තක්.
   4. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමට විවිධ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම් ආශ්‍රිත ආර්ථික කටයුත්තක්.

02. ව්‍යාපාර කිහිපයක් පහත දැක්වේ,

   A. අධ්‍යාපන ආයතනය
   B. ඇඟලුම් කම්හල
   C. රක්ෂණ ආයතනය
   D. බේකරිය
   E. රූපලාවන්‍ය ආයතනය

මේවා අතරින් සේවා නිෂ්පාදන ව්‍යාපාර යටතට ගත හැක්කේ,

1. A, B හා C　　2. A, C හා D
3. A, C හා E　　4. A, D හා E

03. ආයෝජනයේ සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීම ව්‍යාපාරයේ අනාගත වර්ධනය ඉහළ නංවා ගැනීමේ අරමුණින් ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වනු ලබන්නේ,

1. කළමණාකරුවන්.　　2. අයිතිකරුවන්
3. මූල්‍ය ආයතන　　4. ගනුදෙනුකරුවන්

04. ගෝලීය පරිසරයෙන් දේශීය ව්‍යාපාර සඳහා හිතකර මෙන්ම අහිතකර බලපෑම් ද ඇති වේ. එසේ ඇතිවන අහිතකර බලපෑම්වලට උදාහරණයකි.
   1. විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම.
   2. දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදී යාම.
   3. නවීන තාක්ෂණය භාවිතයට ගැනීමට හැකි වීම.
   4. ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබාගත හැකි වීම.

05. ව්‍යාපාර පරිසරය අධ්‍යනයෙන් හඳුනාගත හැකි ශක්තියක් සහ අවස්ථාවක් පිළිවෙලින් දක්වා ඇත්තේ,
   1. අත්දැකීම් සහිත කළමණාකරුවන් සිටීම හා ව්‍යාපාර සඳහා බදු සහන හිමිවීම.
   2. අධිවේගී මාර්ග ඉදිවීම හා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම.
   3. පුහුණු සේවකයින් සිටීම හා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම.
   4. රජය සහන පොලියට ණය ක්‍රම හඳුන්වාදීම හා පිළිගත් සන්නම් නාමයන් පැවතීම.



265

06. හවුල් ව්‍යාපාරයක් ආරම්භකර පවත්වාගෙන යාමේදී ඒ සඳහා අදාල නොවන නීතිමය තත්ත්වයක් වන්නේ,

1. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත.
2. 2007 අංක 07 දරණ සමාගම් පනත.
3. 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත.
4. 1972 අංක 05 දරණ සමූපකාර සමිති පනත.

07. නිශ්චිත කාල සීමාවක් සඳහා ස්ථාවර පොලී ප්‍රතිශතයක් යටතේ ආරම්භ කල හැකි තැන්පතු වර්ගය හඳුන්වන්නේ,

1. ඉතිරි කිරීමේ ගිණුම් ලෙසය
2. ස්ථාවර තැන්පතු ලෙසය
3. ජංගම ගිණුම් ලෙසය
4. අනේවාසික ගිණුම් ලෙසය

08. ඔබට අවශ්‍යව ඇත්තේ බැංකු ජංගම ගිණුමක් විවෘත කිරීමට නම් ඒ සඳහා ඔබ තෝරා ගත යුතු බැංකුව වන්නේ,

1. රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව
2. මහජන බැංකුව
3. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
4. ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව

09. සෑම චෙක්පතක් පහළින් ඇති චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ පළමු අංක පෙළෙන් දක්වා ඇත්තේ,

1. චෙක්පත් අංකය
2. බැංකුවේ අංකය
3. බැංක ශාඛාවේ අංකය
4. බැංකුවේ ගිණුම් අංකය

10. ප්‍රවාහනයේ මූලිකාංග සඳහා නිදසුන් නිවැරදිව දක්වා ඇත්තේ,

1. දුම්රිය, ගුවන් මාර්ග ඉන්ධන ධාරිතාව
2. මහා මාර්ග, මෝටර් රථය, ගෑස්, දුම්රිය ස්ථානය
3. ගුවන් මාර්ග, ගුවන් යානය, බස් රථය, බස් නැවතුම
4. මහා මාර්ග, මෝටර් රථය, පිරිවැය, බස් නැවතුම

11. පහත සන්නිවේදන ක්‍රම පිළිබඳව අවධානය යොමු කරන්න.

A. ඉන්ටර්කොම්
B. විද්‍යුත් තැපැල
C. දැන්වීම් පුවරුව
D. මාණ්ඩලික රැස්වීම්

ඉහත ඒවා අතරින් අභ්‍යන්තර වාචික සන්නිවේදන ක්‍රම ලෙස සැලකිය හැක්කේ,

1. A හා B  2. C හා D  3. A හා D  4. B හා D

12. ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීම හා අරමුණු ඉටු කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීම හා සම්බන්ධ කළමණාකරන ක්‍රියාවලිය හඳුන්වන්නේ,

1. සැලසුම්කරණය ලෙස ය
2. සංවිධානකරණය ලෙස ය
3. මෙහෙයවීම ලෙස ය
4. පාලනය ලෙස ය

13. අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් වන්නේ,

1. නිෂ්පාදිතය , ගුණත්වය , මිල , ප්‍රවර්ධනය
2. නිෂ්පාදිතය , මිල , ස්ථානය , ප්‍රචාරණය
3. නිෂ්පාදිතය , මිල , ස්ථානය , ප්‍රවර්ධනය
4. ස්ථානය , ප්‍රවර්ධනය , මිල , ගුණත්වය

The National e-learning Portal for The General Education



266

14. අලෙවිකරණ මිශ්‍රයේ ප්‍රවර්ධනය විචල්‍යයට අයත් නොවන සාධකය වන්නේ,

1. ප්‍රචාරණය.
2. වට්ටම් හා දීමනා.
3. පෞද්ගලික අලෙවිය
4. විකුණුම් ප්‍රවර්ධනය

---

15. කළමනාකරණ ක්‍රියාවලියේ මූලිකාංගයක් නොවන්නේ,

1. සංවිධානය.
2. පාලනය.
3. මෙහෙයවීම.
4. කාර්යක්ෂමතාවය.

16. සංවිධානකරණයට අයත් කාර්යයක් නොවන්නේ,

1. සන්නිවේදනය.
2. වැඩ බෙදීම.
3. තනතුරු පැවරීම.
4. සම්පත් බෙදා හැරීම.

17. ගිණුම්කරණයේ ප්‍රධානතම අරමුණ ලෙස සැලකෙන්නේ,

1. නීතිමය අවශ්‍යතා ඉටු කිරීමයි.
2. ව්‍යාපාරයේ උපයා ඇති ලාභය ගණනය කිරීමයි.
3. ව්‍යාපාරය පිළිබඳ ඇල්මැති පාර්ශවයන්ට අවශ්‍ය විවිධ තොරතුරු සැපයීම යි.
4. ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය ගණනය යි.

18. අකලංක 2015-01-01 දින රු.250,000.00 ක් ආයෝජනය කරමින් ව්‍යාපාරයක් අරඹන ලදී. 2015-12-31 න් අවසන් වූ වර්ෂයට ව්‍යාපාරයේ මුළු ආදායම රු 160,000.00 ක් හා මුළු වියදම රු.110,000.00 ක් බව ඔහු පවසයි. වර්ෂය තුළ රු.25,000.00 ක් තම පෞද්ගලික අවශ්‍යතාවයක් සඳහා ව්‍යාපාරයෙන් ලබාගෙන ඇත. 2015-12-31 දිනට ව්‍යාපාරයේ හිමිකම කොපමණද ?

1. රු 325,000.00 කි.
2. රු 300,000.00 කි.
3. රු 225,000.00 කි.
4. රු 275,000.00 කි.

19. අනිල්ගේ ව්‍යාපාරයේ 2015 ජනවාරි මාසයේ සුළු මුදල් වියදම් රුපියල් 2,850.00 ක් විය. එදිනට සුළු මුදල් භාරකරු සතුව පැවති අත ඉතිරි මුදල් රු 150 කි. පෙබරවාරි මාසයේ පළමු දින සිට සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම තවත් රුපියල් 500 වැඩි කිරීමට තීරණය කර ඇත්නම් පෙබරවාරි පළමු දින ප්‍රතිපූර්ණය කරන මුදල වන්නේ,

1. රු 2,850.00 කි.
2. රු 3,000.00 කි.
3. රු 3,350.00 කි.
4. රු 3,500.00 කි.

The National e-learning Portal for General Education

20. අසංකගේ ව්‍යාපාරයේ රුපියල් 50,000 භාණ්ඩ සංකට විකුණූ අතර, ඔහු ඒ සඳහා පසුව රුපියල් 50,000 ක චෙක්පතක් ලබාදෙන ලදී. එම චෙක්පත බැංකු ජංගම ගිණුමේ තැන්පත් කළ අතර, එය අගරු වූ බව බැංකුව විසින් අසංකට දැනුම් දී ඇත. මෙම චෙක්පත අගරුවීමට බලපෑ හැකි හේතුවක් නොවන්නේ,

1. අසංකගේ ජංගම ගිණුමේ මුදල් නොතිබීම.
2. සංකගේ ජංගම ගිණුමේ මුදල් නොතිබීම.
3. චෙක්පත් අවිධිමත්ව ලියා තැබීම.
4. චෙක්පතේ අත්සන යොදා නොතිබීම.

21. බැංකු ගිණුම් සංශෝධනයේදී සලකා බැලිය යුතු බැංකු ප්‍රකාශයේ ඇතුළත්ව ඇති අයිතමයක් වන්නේ,

1. සෘජු ප්‍රේෂණ ලැබීම් , ස්ථාවර නියෝග ගෙවීම් ,නිකුත් කර ඉදිරිපත් නොවූ චෙක්
2. සෘජු ප්‍රේෂණ ලැබීම් , ස්ථාවර නියෝග ගෙවීම් ,බැංකු ගාස්තු
3. තැන්පත් කළ නිශ්කාශනය නොවූ චෙක්, බැංකු ගාස්තු, සෘජු ප්‍රේෂණ ලැබීම්
4. තැන්පත් කළ නිශ්කාශනය නොවූ චෙක් ,නිකුත් කර ඉදිරිපත් නොවූ චෙක් , බැංකු ගාස්තු

22. ව්‍යාපාරයක 2016-01-31 දිනට සංශෝධිත බැංකු ගිණුමට අනුව ශේෂය රුපියල් 310,000 කි. එදිනට තැන්පත් කල නිශ්කාශනය නොවූ චෙක්පත් හා නිකුත් කල ඉදිරිපත් නොවූ චෙක්පත් වල වටිනාකම් පිළිවෙලින් රුපියල් 85,000 හා රුපියල් 45,000 ක් විය. 2016-01-31 දිනට බැංකු ප්‍රකාශයේ දැක්වෙන ශේෂය කොපමණද ?

1. රු 350,000.00 කි.
2. රු 310,000.00 කි.
3. රු 265,000.00 කි.
4. රු 270,000.00 කි.

23. පහත සඳහන් ගණුදෙනු වලින් ගැනුම් ජ'නලයේ සටහන් කරන ගණුදෙනුව වනුයේ,

1. ණයට මිලදී ගන්නා සියළු වත්කම්
2. නැවත විකිණීමේ අරමුණින් මිලදී ගන්නා වෙළඳ භාණ්ඩ ණයට ගැනුම්
3. වෙළඳ භාණ්ඩ ණයට ගැනුම්
4. වෙළඳ භාණ්ඩ අත්පිට ගැනුම්

24. බැංකු ජංගම ගිණුම් හරහා ගණුදෙනු සිදු කිරීමේදී ව්‍යාපාරිකයෙකුට අත්විය හැකි ප්‍රතිලාභයක් නොවන්නේ

1. අයිරා පහසුකම් ලැබීම.
2. ප්‍රේෂණ රැස්කරවා ගත හැකිවීම.
3. චෙක්පත් මගින් ගණුදෙනු කළ හැකිවීම.
4. බැංකු ගාස්තු අය කිරීම.

25. රුපියල් 30,000 විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම අමතක කර ගිණුම්කරණ ක්‍රියාවලිය තුළින් ශේෂ පිරික්සුම පිළියෙල කර ඇත. මෙම වැරදීම සිදු කර ඇත්තේ,

1. මූලික සටන් පොත්වල ගනුදෙනු සටහන් කිරීමේදීය.
2. ගණුදෙනු ලෙජරයට පිටපත් කිරීමේදීය.
3. ලෙජර ගිණුම් තුලනය කිරීමේදීය.
4. ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදීය.

26. පහත සඳහන් වැරදි අතුරින් ශේෂ පිරික්සුමේ සමානතාවයට බලපෑමක් ඇති කරන වරදක් වන්නේ.

1. රු 20,000 විකුණුම් ඉන්වොයිසියක් සම්පූර්ණයෙන්ම පොත් වලින් මඟ හැරීම.
2. රු 20,000 ණයට ගැනුම් රු 2,000 ක් ලෙස ගිණුම් වල සටහන්වීම.
3. රු 10,000 ණය ගැතියන්ගෙන් ලැබීම් රු 15,000 ක් ලෙස ගිණුම්වල සටහන්වීම.
4. රු 5,000 අත්පිට විකුණුම් මුදල් පොතේ පමණක් සටහන්වීම.

27. ණය හිමියකු වූ අකිලට ගෙවන ලද රු 2,000 ක මුදල මුදල් පොතේ නිවැරදිව සටහන්ව ඇති නමුත් අකිලගේ ගිණුම් සටහන්වී නොමැත. මෙම වරද නිවැරදි කිරීමට අදාළ නිවැරදි ජ'නල් සටහන වන්නේ,

1. අකිලගේ ගිණුම හර 20,000 මුදල් පොත බැර 20,000
2. අකිලගේ ගිණුම හර 20,000 අවිනිශ්චිත ගිණුම බැර 20,000
3. මුදල් පොත හර 20,000 අකිලගේ ගිණුම බැර 20,000
4. අවිනිශ්චිත ගිණුම හර 20,000 අකිලගේ ගිණුම බැර 20,000

28. ගිණුම් ලිපිකරුවෙකු විසින් පහත ප්‍රකාශයන් සිදු කරයි. මේවා අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ ,

1. ගැනුම් ජ'නලයේ එකතුව ගැණුම් ගිණුමට හර කරයි.
2. සියළු ගැණුම්, ගැණුම් ජ'නලයේ සටහන් කරයි.
3. සුළු මුදල් පොතේ වියදම්වල එකතුව විවිධ වියදම් ගිණුමට හර කරයි.
4. යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ වියදම් යන්ත්‍ර ගිණුමට හර කරයි.



268

29. පොදු ජ'නලය තුළ සටහන් කරන ගණුදෙනුවක් නොවන්නේ,

1. ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා යන්ත්‍රයක් ණය පදනම මත ලබා ගැනීම.
2. වෙළඳ භාණ්ඩ ණයට ගැනුම්.
3. ඉඩමක් ණය පදනම මත ලබා ගැනීම.
4. අයිතිකරු වෙළඳ භාණ්ඩ තම පෞද්ගලික ප්‍රයෝජනය ගැනීම.

30. බැංකු ගිණුමේ සඳහන් ශේෂය බැංකු ගිණුම් විස්තරයේ සඳහන් ශේෂයට වඩා වැඩි වීමට බලපාන හේතුවක් වන්නේ,

1. තැන්පත් කළ නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත් වල අගය
2. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්
3. සෘජු ප්‍රේෂණයක්
4. ඉහත සියල්ලම වේ.

31. ව්‍යාපාරයක ගැනිලි ගිණුම,

1. වත්කම් ගිණුමකි. 2. වියදම් ගිණුමකි.
3. හිමිකම් ගිණුමකි. 4. වගකීම් ගිණුමකි.

32. පොදු ජ'නලයේ ගණුදෙනු සටහන් කිරීමේදී උපයෝගී කරගනු ලබන මූලාශ්‍ර ලේඛනය වන්නේ,

1. ජ'නල් වවුචරය 2. ලදුපත
3. ගැනුම් ඉන්වොයිසිය 4. බැරපත

33. කාලච්ඡේදය අවසානයේ විකුණුම් ජ'නලයේ එකතුව අදාළ ද්විත්ව සටහන් මූලධර්මයන්ට අනුව සටහන් තබනු ලැබේ. මෙහිදී අනුගමනය කරන ද්විත්ව සටහන වන්නේ,

1. මුදල් ගිණුම හර
   විකුණුම් ගිණුම බැර
2. ණයගැති ගිණුම හර
   විකුණුම් ගිණුම බැර
3. විකුණුම් ගිණුම හර
   ණයගැති ගිණුම බැර
4. විකුණුම් ගිණුම හර
   මුදල් ගිණුම බැර

34. භාණ්ඩ ණයට ගැනීම් සටහන් කිරීමේදී අනුගමනය කරනු ලබන ද්විත්ව සටහන වන්නේ,

1. ගැණුම් ගිණුම හර
   මුදල් ගිණුම බැර
2. ගැණුම් ගිණුම හර
   ණයහිමි ගිණුම බැර
3. මුදල් ගිණුම හර
   ගැණුම් ගිණුම බැර
4. ණයහිමි ගිණුම හර
   ගැණුම් ගිණුම බැර

35. මුදල් ගෙවීමේදී උපයෝගී කරගණු ලබන මූලාශ්‍ර ලේඛනය වන්නේ,

1. ලදුපත 2. විකුණුම් ඉන්වොයිසිය
3. ගැණුම් ඉන්වොයිසිය 4. වවුචරය

The National e-learning Portal for The General Education



269

❖ පහත සඳහන් තොරතුරු උපයෝගී කරගනිමින් 36- 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 200,000 |
| 12% බැංකු ණය | | 50,000 |
| ඉඩම් හා ගොඩනැගිලි | 200,000 | |
| තොගය 2009-04-01 | 16,000 | |
| ගැනුම් | 50,000 | |
| විකුණුම් | | 80,000 |
| ණයගැතියෝ | 17,000 | |
| ණයහිමියෝ | | 11,000 |
| රක්ෂණ ගාස්තු | 6,000 | |
| වැටුප් | 15,000 | |
| බැංකු ණය පොලී | 3,500 | |
| ගැනිලි | 2,000 | |
| අතැති මුදල් | 31,500 | |
| | 341,000 | 341,000 |

අමතර තොරතුරු ඃ

❖ 2010-03-31 දිනට ඃ තොගය රු. 8,000
උපචිත රක්ෂණ ගාස්තු රු. 1000

❖ ණයගැතියන්ගෙන් 5% ක් බොල්ණය ලෙස කපා හැරිය යුතුය.

36. 2010-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සුමුදුගේ ව්‍යාපාරයෙන් විකුණුම් බඩුවල පිරිවැය,

1. රු. 56,500 කි.
2. රු. 58,000 කි.
3. රු. 64,500 කි.
4. රු. 66,000 කි.

37. 2010-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ දළ ලාභය,

1. රු. 13,500 කි.
2. රු. 22,000 කි.
3. රු. 21,500 කි.
4. රු. 23,500 කි.

38. මෙම ව්‍යාපාරයේ 2010-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන ලාභාලාභ ගිණුමේ බැංකු ණය පොලී ලෙස දැක්විය යුත්තේ,

1. රු. 2,500 කි.
2. රු. 3,500 කි.
3. රු. 6,000 කි.
4. රු. 9,500 කි.

39. 2010-03-31 දිනට මෙම ව්‍යාපාරයේ ශේෂ පත්‍රයේ දැක්විය යුතු ණයගැතියන්ගේ ශුද්ධ අගය වනුයේ,

1. රු. 14,250 කි.
2. රු. 14,520 කි.
3. රු. 15,000 කි.
4. රු. 16,150 කි.

40. 2010-03-31 දිනට මෙම ව්‍යාපාරයේ ශේෂ පත්‍රයෙහි දැක්වෙන මුළු වත්කම්වල එකතුව,

1. රු. 253,750 කි.
2. රු. 254,500 කි.
3. රු. 254,750 කි.
4. රු. 255,650 කි.

The National e-learning Portal for The General Education

முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணைமதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පත්‍රය - II<br>வணிகமும் கணக்கீட்டுக் கல்வியும்வினாத்தாள்-II<br>Business & Accounting Studies Paper - II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |
|---|---|---|

## II කොටස

සැලකිය යුතුයි :

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න 02 ක් ද,
- ❖ II කොටසින් ප්‍රශ්න 02 ක් ද තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. පහත සිද්ධිය ඇසුරෙන් අංක (I) සිට අංක (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

මනුෂ "රුහුණු යෝගට්" නමින් යෝගට් බෙදාහැරීමේ ව්‍යාපාරයක් 2015-01-01 දින තමා සතු රු.800,000 ක් වටිනා වෑන් රථයක් ද, මුදලින් රු.500,000 ක් ද යොදා ආරම්භ කරන ලදී. අලෙවිය සඳහා අවශ්‍ය වන යෝගට් ඔහු විසින් සි/ස රන්රස යෝගට් නිෂ්පාදකයින්ගෙන් මිලට ගනු ලබයි. 2015-01-10 දින බැංකු ණය රු. 100,000 ක් ලබා ගත් අතර 2015-01-11 දින එම මුදල යොදා ජංගම ගිණුමක් මහජන බැංකුවේ ආරම්භ කරන ලදී.

මීට අමතරව පහත ගනුදෙනු 2015 ජනවාරි මාසය තුලදී සිදු විය.

| | | |
|---|---|---|
| 2015-01-12 | ශීතකරණයක් මිලට ගත්තා | රු. 30,000 |
| 2015-01-15 | අත්පිට ගැණුම් | රු. 28,000 |
| 2015-01-16 | වෑන් රථ රියදුරුගේ මාසික වැටුප (චෙක්පතකින් ගෙව්වා) | රු. 20,000 |
| 2015-01-18 | අත්පිට විකුණුම් | රු. 50,000 |
| 2015-01-20 | ණයට විකුණුම් | රු. 8,000 |
| 2015-01-25 | ඉන්ධන සහ වෙනත් වියදම් | රු. 6,300 |
| 2015-01-26 | ජංගම ගිණුමේ තැන්පත් කළා | රු. 40,000 |

සැළකිය යුතුයි : 2015-01-31 දිනට ව්‍යාපාරයක සතු සියලුම යෝගට් විකිණා ඇත.

i. අ) මනුෂගේ ව්‍යාපාරයේ නිෂ්පාදිතය, නිෂ්පාදනයේ ස්වභාවය අනුව නම් කරන්න. (ල 01)
   ආ) මනුෂගේ ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද ? (ල 01)

ii. මනුෂගේ ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු බව ඔහුගේ මිතුරකු ඔහුට දැන්විය. මේ පිළිබඳ ඔබගේ අදහස දක්වන්න. (ල 02)

iii. මනුෂ විසින් කරනු ලබන වෙළඳාම සහ සි/ස රන්රස යෝගට් සමාගම විසින් කරනු ලබන වෙළඳාම වෙන වෙනම නම් කරන්න. (ල 02)

iv. අ) මෙම ව්‍යාපාරය සඳහා මනුෂ විසින් ලබාගත යුතු යැයි ඔබ යෝජනා කරන රක්ෂණ ඔප්පුවක නමක් ලියන්න. (ල 01)
   ආ) මනුෂට ලැබෙන්නාවූ චෙක්පත් වඩාත් සුරක්ෂිත ආකාරයට ලැබීමට නම් ඒ සඳහා යෙදිය යුතු රේඛණය ඇඳ පෙන්වන්න. (ල 01)

v. මනුෂගේ ව්‍යාපාරයේ 2015-01-01 දිනට ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න. (ල 02)

vi ඉහත ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය මූලික පොත් 02 ක් සහ ඊට අදාළ මුලාශ්‍ර ලේඛන 02 ක් ලියන්න.(ල 02)

vii 2015-01-31 දිනට මුදල් පොතේ ශේෂය දක්වන්න. (ල 02)



271

viii 2015-01-31 දිනෙන් අවසන් මාසය සඳහා දළ ලාභය [illegible]

ix 2015-01-31 දිනට මනුෂගේ ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න. (ල 02)

x මෙම ව්‍යාපාරයේ 2015-01-31 දිනට ඇති ජංගම වත්කම් 02 ක් සහ ජංගම නොවන වත්කම් 02 ක් නම් කරන්න. (ල 02)

( ල 2 x 10 = 20 )

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02.

i. අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස්කම් 04 ක් ලියන්න. (ල 02)

ii. ව්‍යාපාර කෙරෙහි ඇල්ම දක්වන පාර්ශවයන් 02 ක් නම් කර එක් එක් පාර්ශවය ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ බැගින් දක්වන්න. ( ල 02)

iii. විලාසිතා නමින් ප්‍රකට ඇඳුම් අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය නිලන්ත ප්‍රනාන්දු තමාගේ බාල සොහොයුරා වන අමන්ත ප්‍රනාන්දුව එම ව්‍යාපාරයට සම්බන්ධ කරගනිමින් ප්‍රනාන්දු සහ පුත්‍රයෝ නමින් ව්‍යාපාරය පුළුල් කරන ලදී. මෙහි සඳහන් ව්‍යාපාර සංවිධාන වර්ග 02 වෙන වෙනම සඳහන් කර එක් ව්‍යාපාර සංවිධානයක ප්‍රතිලාභ 02 ක් සඳහන් කරන්න. ( ල 02)

iv. ඉහත (III) හි සඳහන් ප්‍රනාන්දු සහ පුත්‍රයෝ ව්‍යාපාරය සංස්ථාපිත සමාගමක් බවට පත්කිරීමෙන් ලැබෙන වාසි 02 ක් දක්වන්න. ( ල 02)

( ලකුණු 2 x 4 = 8 )

03. i. සමුපකාර සමිති සහ රාජ්‍ය සංස්ථා අතර දැකිය හැකි වෙනස්කම් 02 ක් ලියා දක්වන්න. (ල 02)

ii. ව්‍යාපාර සංවිධානයක පරිමාණය තීරණය කිරීම සඳහා යොදාගනු ලබන නිර්ණායකයන් 02 ක් දක්වන්න. (ල 02)

iii. ඒක පුද්ගල ව්‍යාපාරයක නාමය ලියාපදිංචි කිරීම තුළින් අත්කර ගත හැකි වාසි 04 ක් ලියන්න. (ල 02)

iv. ජංගම ගිණුමක් මගින් ගිණුම් හිමියාට අත්වන වාසි 04 ක් දක්වන්න. (ල 02)

04. i. අ) රක්ෂණයට අදාළ මූලධර්ම 02 ක් දක්වන්න. (ල 01)

ආ) සුදුසු සන්නිවේදන ක්‍රමයක් තෝරාගැනීමේදී සලකා බැලිය යුතු සාධක 02 ක් දක්වන්න. (ල 01)

ii. දුම්රිය මාර්ග භාවිතයෙන් ලැබෙන වාසි 02 ක් ද අවාසි 02 ක් ද දක්වන්න. (ල 02)

iii. කළමනාකරණ කාර්යයන් 04 ක් නම් කරන්න. (ල 02)

iv අලෙවිකරණ මිශ්‍රයට අයත් ප්‍රධාන කොටස් 04 ක් නම් කරන්න. (ල 02)

( ලකුණු 2 x 4 = 8 )

## II කොටස - ගිණුම්කරණය

05. i. අ) වත්කම ප්‍රධාන වශයෙන් වර්ග 2 කි. ඒ මොනවාද ? (ල 01)

ආ) ගිණුම්කරණ තොරතුරු පිළිබඳ ඇල්මැති පාර්ශව 02 ක් නම් කරන්න. (ල 01)

ii. නිලන්තිගේ ව්‍යාපාරයේ 2015 මැයි මස තුළදී සිදුවූ ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

වත්කම් (රු.) = හිමිකම් + වගකීම්

| | ඉඩම් සහ ගොඩනැගිලි | + භාණ්ඩ තොග | + ණයගැති | + මුදල් | + බැංකු | = හිමිකම් | ණයහිමි | බැංකු ණය |
|---|---|---|---|---|---|---|---|---|
| 5.1 ශේෂය | 1,000,000 | +200,000 | +20,000 | +28,000 | +7,4000 | =661,000 | +61,000 | +600,000 |
| 5.8 | | +100,000 | | | | | +100,000 | |
| 5.10 | | -60,000 | | 100,000 | | = 40,000 | | |
| 5.14 | | | - 8,000 | +8,000 | | | | |
| 5.16 | | | | -2,000 | | = -2,000 | | |
| 5.20 | | -20,000 | +32,000 | | | =+12,000 | | |
| 5.31 | 1,000,000 | 220,000 | 44,000 | 134,000 | 74,000 | =711,000 | 161,000 | 600,000 |

සැ.යු :- මාසය තුළදී අයිතිකරු මුදල් ගැනිලි කිසිවක් සිදුකර නැත.

අවශ්‍ය වන්නේ,

එක් එක් දිනයේ සිදුවී ඇති ගණුදෙනුව අගයන් සහිතව දක්වන්න. ( ල 05)

iii) අනූෂාගේ ව්‍යාපාරයේ 2015-01-31 දිනට බැංකු ගිණුමේ හර ශේෂය රු. 28,100 ක් වූ අතර එදිනට බැංකු ගිණුමේ ශේෂය වෙනස් අගයක් විය. වෙනසට හේතු සෙවීමේදී පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

1. තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් වල වටිනාකම රු. 5,600 කි.
2. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් වල වටිනාකම රු. 8,000 යි.
3. බැංකුව අයකළ බැංකු ගාස්තු රු. 3,000
4. ණයගැති ප්‍රේෂණ රු. 18,500
5. ස්ථාවර නියෝග මත රක්ෂණ වාරික ගෙවීම් රු. 4,000 යි.

අවශ්‍ය වන්නේ,

අ) 2015-01-31 දිනට සංශෝධිත බැංකු ගිණුම ( ල 03)

ආ බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කර 2015-01-31 දිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය ( ල 02)

( මුළු ලකුණු 12 )

06. i. අ) ගැනුම් ජ'නලය සහ පොදු ජ'නලයට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරන්න. (ල 01)

ආ) මුදල් පොතේ ද්විත්ව කාර්ය ලියා දක්වන්න. (ල 01)

ii. වික්‍රමගේ ව්‍යාපාරයේ 2015-12-31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම සමාන නොවූයෙන් එහි වෙනස අවිනිශ්චිත ගිණුමට මාරු කරන ලදී. පසුව වෙනසට හේතු වූ කරුණු සෙවීමේදී පහත කරුණු අනාවරණය විය.

01. ගැනුම් ගිණුමේ එකතුව රු 10,000 ක් අඩුවෙන් සටහන් කර ඇත.
02. සුළු මුදල් පොතේ ගමන් ගාස්තු තීරුවේ එකතුව රු 1,500 ගමන් ගාස්තු ගිණුමේ සටහන් කර නැත.
03. රක්ෂණ ගාස්තු ගිණුමේ ශේෂය වූ රු 20,000 ක් ශේෂ පිරික්සුමෙන් මඟ හැර ඇත.
04. රු 40,000 ක් වූ ලැබූ ගෙවල් කුලී මුදල් පොතට හර කිරීම හැර වෙනත් සටහනක් තබා නොමැත.

අවශ්‍ය වන්නේ :-

❖ ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් (ල 04)

❖ අවිනිශ්චිත ගිණුම පිළියෙල කර ශේෂ පිරික්සුමේ ඓක්‍යය අතර තිබූ වෙනස දක්වන්න. (ල 02)

iii. සයිමන්ගේ ව්‍යාපාරයේ 2015-08-01 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරිව තිබූ මුදල රු. 250 කි. අගෝස්තු මාසයේ සුළු මුදල් ගනුදෙනු පහත පරිදි වේ.

| දිනය | වවු. අංකය | විස්තරය | වටිනාකම ( රු. ) |
|---|---|---|---|
| 2015-08-01 | - | ප්‍රධාන මුදල් භාරකරුගෙන් ලැබුණා | 2,500 |
| 2015-08-02 | 01 | තැපැල් මුද්දර ගාස්තු | 120 |
| 2015-08-04 | 02 | ගමන් ගාස්තු | 150 |
| 2015-08-08 | 03 | ලිපි ද්‍රව්‍ය | 290 |
| 2015-08-16 | 04 | කම්කරුකුලී | 550 |
| 2015-08-22 | 05 | පෙරේරාට ගෙවීවා | 400 |

ඉහත තොරතුරු ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

i. ඉහත ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණද ? (ල 01)

ii. 2015-08-31 දින ප්‍රධාන මුදල් භාරකරු විසින් ප්‍රතිපූරණය කරන ලද මුදල් කොපමණද ? (ල 01)

iii. 2015 09 01 දින සුළු මුදල් අග්‍රිමය රු. 500 කින් වැඩි කළේ නම් ප්‍රතිපූරණය කරනු ලබන වටිනාකම කොපමණද ? (ල 02)

( මුළු ලකුණු 12 )

07. i. ආ) ව්‍යාපාරයක මෙහෙයුම් ප්‍රතිඵලය සහ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කිරීම සඳහා පිළියෙල කරන ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන 02 ක නම් කරන්න. ( ල 01)

ආ) බැංකු ප්‍රකාශයේ හර පැත්තේ දැකිය හැකි අයිතම 02 ක් නම් කරන්න. (ල 01)

ii. 2015-12-31 දිනට නදුන්ගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 210,000 |
| ආයෝජනය 10% | 10,000 | |
| බැංකු ණය 10% | | 100,000 |
| පරිපාලන වේතන | 100,000 | |
| විදුලිය වියදම | 10,000 | |
| රක්ෂණය | 8,000 | |
| විකුණුම් | | 385,000 |
| විකුණුම් පිරිවැය | 136,000 | |
| ණය ගැතියෝ | 25,000 | |
| දුන් වට්ටම් | 16,000 | |
| ණය හිමි | | 12,000 |
| බැංකු | 150,000 | |
| මුදල් | 252,000 | |
| | 707,000 | 707,000 |

අමතර තොරතුරු :-

1. 2015-12-31 දින උපචිත විදුලි වියදම් රු.2,000 යි.
2. 2015-12-31 දිනට ලැබිය යුතු ආයෝජන ආදායම් සහ බැංකු ණය පොලි උපචිතව ඇත.
3. ණයගැතියන්ගෙන් රු.3,000 ක බොල්ණය ලෙස කපා හැරිය යුතුය.

අවශ්‍ය වන්නේ,

i. 2015-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය ( ල 06)

ii. ඉහත ගැලපිලි සටහන් කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් ( ල 04)

( මුළු ලකුණු 12 )



274

e තක්සලාව The National e-learning Portal for The General Education